රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: **35/92**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1992 දෙසැම්බර් මස 21 වෙනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
ප්‍රධාන ලේකම්වරුන්,
දිසාපතිවරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන් සහ
ප්‍රාදේශීය ලේකම්වරුන් සහ
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් වෙත.

**රජයේ නිලධරයන් පිළිබඳ විනය පරීක්ෂණ ඉක්මන් කරවීම**
**ආයතන සංග්‍රහය සංශෝධනය කිරීම - XLVIII පරිච්ඡේදය.**

රජයේ නිලධරයන් පිළිබඳ විනය පරීක්ෂණ ඉක්මන් කරවීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 1990.08.17 දිනැති අංක. 35/90, 1991.03.18 දිනැති අංක. 35/90 (1) හා 1992.03.03 දිනැති අංක. 35/90 (II) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වෙනුවට මෙම චක්‍රලේ'යේ සඳහන් විධිවිධාන බල පැවැත්වෙනු ඇත. මේ අනුව 1981 දී නිකුත් කරන ලද ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ අංක. 12:1, 12:7, 13:2, 14:4, 14:5, 18:1:1 හා 21:6 යන උප වගන්ති සංශෝධනය වේ. අංක. 5:2:1, 10:1:1, 10:1:2, 12:1:1, 12:1:2, 12:2:1, 12:7:1, 12:7:2, 14:5:1, 18:3:1, 18:3:2, 18:3:3, 18:6 හා 21:7 යන උප වගන්ති අළුතින් එකතුව ක්‍රියාත්මක වේ.

02. 5:2:1 චෝදනා පත්‍රයක් නිකුත් කළ දිනට පසුව මාස තුනකට අධික කාලයක් ඉකුත් වී ඇති විට, අදාළ චූදිත නිලධරයා සුදුසු පරිදි නැවත සේවයෙහි පිහිටුවිය යුතු අතර, 12:7 උප වගන්තියෙහි සඳහන් කාලසීමාව ඇතුළත දී පරීක්ෂණ පවත්වා වාර්තාව සම්පූර්ණ කළ යුතුය. එසේ චෝදනා පත්‍රයක් නිකුත් කොට නොමැති අවස්ථාවක දී වුව ද චූදිත නිලධරයා සුදුසු පරිදි සේවයේ පිහිටුවිය යුතු අතර, මාසයක් ඇතුළත දී චෝදනා පත්‍රයක් නිකුත් කොට පරීක්ෂණය පවත්වා මාස තුනක් ඇතුළත දී වාර්තාව ඉදිරිපත් කළ යුතුය. එහෙත්, වංචාවක් නිසා නිලධරයකුගේ වැඩ තහනම් කොට ඇති අවස්ථාවක දී,

(1) වැඩ තහනම් කළ දින සිට මාසයක් ඇතුළත දී එම වංචාව ගැන පරීක්ෂණයක් පවත්වා නිලධරයා නැවත සේවයෙහි නොපිහිටුවා චෝදනා පත්‍රයක් නිකුත් කළ යුතුය.

(2) එයින් මාස තුනක් ඇතුළත දී පරීක්ෂණය අවසන් කොට වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

03. 10:1:1 වැඩ තහනම් කොට මාසයක් ඇතුලත චෝදනා පත්‍රය නිකුත් කළ යුතුය. ගබඩා භාරකරුවෙකු භාරයේ තිබූ ගබඩා භාණ්ඩ තොග ගණන් ගැනීම අවශ්‍ය විය හැකි බැවින් ගබඩා භාරව සිටින නිලධරයකුට වැඩ තහනම් කිරීමෙන් පසු මාස තුනක් නොඉක්මවා චෝදනා පත්‍රය නිකුත් කළ යුතුය. ඔහු භාරයේ තිබූ භාණ්ඩ වර්ග වලින් චෝදනාවට අදාල භාණ්ඩ සම්පූර්ණයෙන්ම ගණන් කිරීම අවශ්‍ය වන්නේය.

10:1:2 චෝදනා පත්‍රයක් නිකුත් කළ පසුව විනය පරීක්ෂණය ආරම්භ කරනතුරු එය අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමට විනය බලධරයාට හැකිය. එසේ වුව ද එවැනි අවස්ථාවක 11:5 හා 11:6 වගන්තිවල විධිවිධාන වලට යටත්ව එකී ලේඛණ පරීක්ෂා කිරීමෙන් හෝ හරස් ප්‍රශ්න ඇසීමෙන් සංශෝධිත චෝදනා සම්බන්ධයෙන් තම නිර්දෝෂීභාවය ඔප්පු කරලීමට ප්‍රමාණවත් අවස්ථාවක් චූදිත නිලධරයාට ලබාදීම, විනය පරීක්ෂණ මණ්ඩලය විසින් කළ යුතුය.

04. 12:1 විනය පරීකෂණ නිලධරයකු කුමන වර්ගයකට අයත් අයෙක් විය යුතු ද යන්න තීරණය කිරීම මින්පසු විනය බලධරයාට අයත් කාර්යයක් වන්නේ ය. නීතිඥවරයෙකු විනය පරීක්ෂණ නිලධරයකු වශයෙන් පත්කර ගැනීමට යම් චූදිත නිලධරයෙකුට අවශ්‍ය නම් ඒ බව විනය බලධරයාට ප්‍රමාණවත් හේතු සාධක සහිතව දන්වා සිටීමට චූදිත නිලධරයාට ඉඩ ඇත.

12:1:1 රජයේ සේවයේ නිරත නිලධරයන්ගෙන් විනය පරීක්ෂණ නිලධරයෙක් පත් කිරීම හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලියාපදිංචි පරීක්ෂණ නිලධාරි මණ්ඩලයෙන් නිලධරයෙකු තෝරා ගැනීමට හෝ පුළුවන.

12:1:2 රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලියාපදිංචි විනය නිලධාරි මණ්ඩලයට පහත දැක්වෙන වර්ගවල පරීක්ෂණ නිලධාරීහු අයත් වෙති.

(1) රජයේ සේවයෙන් විශ්‍රාමලත් මාණ්ඩලික නිලධරයන්,
(2) දස වසරකට වඩා පළපුරුද්දක් ඇති නීතිඥයන්.

මෙම සංචිතය වරින් වර සංශෝධනය කොට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ. විනය පරීක්ෂණ නිලධරයන් එක් අයෙකුට වැඩි සංඛ්‍යාවක් පත් කළ විට විනය බලධරයා විසින් ඔවුන්ගෙන් එක් අයෙකු සභාපති වශයෙන් පත් කළ යුතුය.

05. 12:2:1 පරීක්ෂණ නිලධරයෙක් පත් කිරීමේ සෑම ලිපියකම පහත සඳහන් කරුණු අඩංගු විය යුතුය.

(1) සේවයෙහි සිටින රාජ්‍ය නිලධරයන් පරීක්ෂණ නිලධරයන් ලෙස පත්කොට නිකුත් කරන පත්වීම් ලිපියෙහි පහත සඳහන් ඡේදය ඇතුලත් කළ යුතුය.

“ පරීක්ෂණයක් පැවැත්වීම රාජ්‍ය සේවයේ ඔබේ රාජකාරියේ එක් කොටසක් ඉටු කිරීමක් වන බවත්, එය ඔබ විසින් අපක්ෂපාතීව හා

කඩිනම්ව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ජේදයේ 14:1 වගන්තියට අනුකූලව පවත්වා මෙම ලිපිය ලැබී ලිත් මාස තුනක් ඇතුලත වාර්තාව ඉදිරිපත් කළ යුතු බවත්, මෙයින් දන්වමි. එසේ කිරීමට අපොහොසත් වුවහොත් ඔබට විරුද්ධව විනයානුකූල පියවර ගැනීමට සිදුවනු ඇත. "

(2) ඔවුන් රාජ්‍ය පරිපාලන සංවිතයේ ලියාපදිංචි විනය පරීක්ෂණ මණ්ඩල නිලධරයන් වන විටදී පහත සඳහන් ජේදය ඇතුලත් කළ යුතුය.

" මෙම ලිපිය ලැබී ලිත් මාස තුනක් ඇතුලත ඔබගේ වාර්තාව ඉදිරිපත් කළයුතු බවත්, එසේ කිරීමට අපොහොසත් වුවහොත් පහත සඳහන් පරිදි කටයුතු කිරීමට සිදුවන බවත් දන්වමි.

(අ) මාසයකට වාඩි කාලයක් ප්‍රමාද වුවහොත් ඔබගේ දීමනාවෙන් 10%ක් කපා හැරීම,
(ආ) මාස දෙකකට වැඩි කාලයක් ප්‍රමාද වුවහොත් ඔබගේ දීමනාවෙන් 20%ක් කපා හැරීම,
(ඇ) මාස 3 කට වැඩි කාලයක් ප්‍රමාද වුවහොත් ඔබගේ දීමනාවෙන් 35%ක් කපා හැරීම,
(ඈ) මාස 4 කට වැඩි කාලයක් ප්‍රමාද වුවහොත් මෙම ලිපියෙන් කර ඇති පත් කිරීම අවලංගු කිරීම සහ ලියාපදිංචි මණ්ඩලයෙන් නම කපා හැරීම "

06. 12:7 පරීක්ෂණය භාරදී තුන්මසක් ඇතුලත නිලධරයා විසින් පරීක්ෂණය පවත්වා අවසන් කොට වාර්තාව භාරදිය යුතුය. එසේ නොකළහොත් හෝ සාධාරණ හා නොවැළැක්විය හැකි හේතූන් මත පරීක්ෂණය පමා වූයේ නම් එයට හේතු මාස 03ක කාලය තුළ, සිද්ධීන් ඇති වූ වහාම හා ඇතිවිය හැකි බව දැනගත් වහාම ඒ බව විනය බලධරයාට දන්වා ඇත්නම් මිස පරීක්ෂණ නිලධරයා රජයේ නිලධරයෙක් නම්, විනයානුකූල ක්‍රියා මාර්ගයක් ගැනීම සඳහා ඔහුගේ විනය බලධරයාට ඔහු ගැන වාර්තා කළ යුතුය. පරීක්ෂණ නිලධරයා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ සංවිතයට අයත් අයෙක් නම් 12:2:1 උප වගන්තියෙහි (2) ජේදයේ සඳහන් ක්‍රියා මාර්ගයක් ගත යුතුය.

12:7:1 18:3:1 උප වගන්තියෙහි සඳහන් කර ඇති වර්ගයේ නිලධරයන් හැර අනෙක් නිලධරයන් සම්බන්ධයෙන් වූ විට, පරීක්ෂණ නිලධරයා මාස තුන අවසානයේ දී තම වාර්තාව ඉදිරිපත් කොට නැත්නම් චූදිත නිලධාරී සුදුසු පරිදි යළි සේවයේ පිහිටුවා, අනතුරුව පරීක්ෂණ කරගෙන යා යුතුය.

12:7:2 පරීක්ෂණ කටයුතු ඉක්මනින් අවසන් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඒ ඒ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානියන්, විනිශ්චය සභා හා පරීක්ෂණ නිලධරයන් වෙත වරින් වර නිකුත් කරනු ඇත.

07. 13:2 චූදිත නිලධරයෙකු වෙනුවෙන් පෙනී සිටීමට විනය බලධරයා විසින් අවසර දිය යුත්තේ සේවයේ නියුක්ත හෝ විශ්‍රාම ලැබ සිටින එක් නිලධරයෙකුට පමණකි. චූදිත නිලධරයන් කිහිප දෙනෙකු වෙනුවෙන් වුව ද එක් නිලධරයෙකුට පෙනී සිටිය හැකිය. රජය වෙනුවෙන් නීතිඥයෙකුට පෙනී සිටීම සඳහා අවසර දීමට විනය බලධරයාට හැකිය. එබඳු අවස්ථාවල දී තමා වෙනුවෙන් පෙනී සිටීම සඳහා නීතිඥයෙකු යෙදවීමේ අයිතිවාසිකම චූදිත නිලධරයාට ලැබිය යුතුය.

08. 14:4 පරීක්ෂණ නිලධරයාට චෝදනා පත්‍රයක් සංශෝධනය කිරීමට බලයක් නැත. විනය පරීක්ෂණයක් ආරම්භ වූ පසුව චෝදනා පත්‍රය සංශෝධනය කිරීම කළ යුත්තේ විනය බලධරයාගේ ලිඛිත නියෝගය මත පැමිණිලිල මෙහෙයවන නිලධරයා විසිනි. විනය පරීක්ෂණයක් ආරම්භ වූ පසුව චෝදනා පිළිබඳව, චෝදනා පත්‍රය කොටස් වශයෙන් සංශෝධනය කිරීම හෝ අලුත් චෝදනා ඉදිරිපත් කිරීමට දෙවරක් පමණක් අවසර දෙනු ලැබේ. ඒ අනුව සාක්ෂිකරුවන් යළි කැඳවීම, අලුත් සාක්ෂිකරුවන් කැඳවීම හෝ අවශ්‍ය යයි සලකන වෙනත් ලිපි ලේඛන සලකා බැලීමට පැමිණිලිල මෙහෙයවන නිලධරයා විසින් ඉල්ලා සිටින අවස්ථාවල දී, විනිශ්චය සභාව ඒ සඳහා ඉඩදිය යුතුය. එතකුදු වුවත්, එවැනි අවස්ථාවක 11:5 හා 11:6 වගන්තිවල විධිවිධානවලට යටත්ව එකී ලේඛණ පරීක්ෂා කිරීමෙන් හෝ හරස් ප්‍රශ්න ඇසීමෙන් හෝ සංශෝධිත චෝදනා සම්බන්ධයෙන් තම නිර්දෝෂීභාවය ඔප්පු කරලීමට ප්‍රමාණවත් අවස්ථාවක් චූදිත නිලධරයාට ලබාදීම, විනය පරීක්ෂණ මණ්ඩලය විසින් කළ යුතුය.

09. 14:5 කාර්ය පරිපාටිය පිළිබඳ ඕනෑම කරුණක් සසම්බන්ධයෙන් හෝ කාර්ය පරිපාටියට අදාළ හේතු පිට පැන නගින ඕනෑම විරෝධතාවයක් සසම්බන්ධයෙන් හෝ විනිශ්චය සභාව ගන්නා තීරණය අවසාන තීරණය වන්නේය. එබැවින් එබඳු කරුණුවල දී විනිශ්චය සභාවක් විසින් ගුරුපදේශ කොට ගත යුත්තේ " පරීක්ෂණයේ පරමාර්ථය වනුයේ ඉක්මනින් ඇත්ත නැත්ත සොයා ගැනීම වන බැවින් කාර්ය පරිපාටිමය වූ හෝ අන්‍ය වූ හෝ විධිමාත්‍ර කරුණු නිසා පරීක්ෂණයට බාධාවක් වන්නට ඉඩ නොතැබිය යුතුය. " යන මූලධර්මයයි.

14:5:1 චූදිත නිලධරයකු හිතාමතා පරීක්ෂණයක් පමා කරන්නේ නම්, හෝ ඊට බාධා පමුණුවන්නේ නම් පහත සඳහන් ක්‍රියා මාර්ගය ගත යුතුය.

(1) පිළිගත හැකි හේතුන් රහිතව ඔහු නොකඩවා දින දෙකක් නොපැමිණෙන්නේ නම් පරීක්ෂණය ඒකපාක්ෂිකව පැවැත්විය යුතුය.

(2) එසේ නොව, ඔහු වෙනත් යම් අයුරකින් පරීක්ෂණය පැවැත්වීමට බාධා පමුණුවයි නම් සහ 12:7 වගන්තියෙහි නියමිත මාස තුන ඇතුළත දී තම පරීක්ෂණය නිම කිරීමට පරීක්ෂණ නිලධරයාට නොහැකි වේ නම්, එවැනි අවස්ථා උද්ගත වූ වහාම හෝ එම පරීක්ෂණය නිම කිරීමට නියමිත මාස තුන අවසන්වීමට පෙර, එම අවහිරතාවය ගැන විනය බලධරයාට වාර්තා කළ යුතුය. චූදිත නිලධරයා එම පරීක්ෂණයට හිතාමතාම අවහිරතා පමුණුවන බවට තමාට ඇති විශ්වාසය පිළිබඳ සම්පූර්ණ හේතු පරීක්ෂණ නිලධරයා විසින් දැක්විය යුතුය.

(3) පරීක්ෂණ නිලධරයාගේ පැමිණිල්ල නිවැරැදි බවට විනය බලධරයා සෑහීමකට පත්වී නම් යම් නිලධරයකු නැවත සේවයේ පිහිටුවීමට කිසිදු ක්‍රියාවක් නොකළ යුතුය. ඔහු නැවත සේවයෙහි පිහිටුවිය යුත්තේ පරීක්ෂණය අවසන් වූ විට පමණි. සේවයෙහි පිහිටුවා ඇත්නම්, යළි වැඩ තහනම් කළයුතු අතර අඩ වැටුප් ද නොගෙවිය යුතුය. චෝදනා වලින් නිදහස් වුව ද මෙම කාලයට වැටුප් අහිමි විය යුතුය.

10. 18:1:1 යම් නිලධරයකුට එරෙහිව අධිකරණයේ නඩුවක් පැවරීමට කටයුතු කරගෙන යාම හෝ පවරා ඇති අවස්ථාවක පරීක්ෂණයක් ආරම්භ කිරීමට පෙර එම නඩුව විනිශ්චය කොට අවසාන වනතුරු පමාවීම අනවශ්‍යය. යම් චූදිතයෙකු උසාවියේ දී නිදහස් කරනු ලැබ සිටි පමණින්ම ඔහු නැවත සේවයෙහි පිහිටුවීම අවශ්‍ය නොවේ. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු සිහි තබාගැනීම මැනවි.

(1) යම් චූදිතයෙකුට එරෙහිව උසාවියෙහි නඩුවක් පැවරීමේ අරමුණ වන්නේ රටහි නීතියට පටහැනිව ඔහු යම් වැරදි කර තිබේදැයි නිශ්චය කිරීමයි.

(2) උසාවියක දී චූදිතයෙකු නිදහස්වීම සිදුවිය හැක්කේ ඔහුගේ නිර්දෝෂීභාවය ඔප්පුවීමෙන් පමණක් නොවේ. නඩුව නිසි ආකාරව පවරා නොතිබීම, නඩුව ඉල්ලා අස්කර ගැනීම, නඩුව අධිකරණයෙන් ඉවත දැමීම, චෝදනා නිසි ලෙස ඉදිරිපත් කර නොතිබීම, පැමිණිල්ල හෝ සාක්ෂි ඉදිරිපත් නොවීම, සාක්ෂි පරස්පර විරෝධීවීම. දෙපක්ෂය සමාදනයකට පත්වීම හෝ නඩුව පවත්වාගෙන යා නොහැකි වෙනත් තත්ත්වයක් උද්ගතවීම එයට හේතු විය හැකිය.

(3) යම් නිලධරයකුට එරෙහිව පරීක්ෂණයක් මගින් චෝදනා විභාග කිරීමේ අරමුණ වන්නේ ඔහු රාජ්‍ය සේවකයකු වශයෙන් විනය විරෝධී ක්‍රියාවක් කර තිබේ ද හා රජයට සහ රාජ්‍ය සේවයට පාඩුවක් හෝ අපකීර්තියක් සිදු කොට ඇත්දැයි නිශ්චය කිරීම වේ. චූදිතයා නෛතික වශයෙන් සැළකිය හැකි යම් වරදක් සිදුකොට ඇත්දැයි නිශ්චය කිරීම පරීක්ෂණ නිලධරයාගේ රාජකාරියෙහි කොටසක් නොවේ.

(4) නිලධරයා අත් අඩංගුවට ගෙන නැත්නම්, ඔහුට විරුද්ධව විනය බලධරයා විසින් දෙපාර්තමේන්තු ක්‍රියා මාර්ගයක් ගැනීමට ඉහත සඳහන් ක්‍රියා පරිපාටිය පරිබාධකයන් නොවන්නේ ය. නිලධරයා අත් අඩංගුවට ගෙන ඇත්නම්, ඔහු මුදවා හරිනු ලැබූ පසු විනයානුකූලව ක්‍රියා කිරීම දිගටම කරගෙන යා හැක. මෙහිලා උසාවියෙන් කෙරෙන කටයුතු ආරම්භ වන්නට ආසන්නව තිබිය දී හෝ එම කටයුතු කරගෙන යනු ලබන විට දී හෝ විනය බලධරයා විසින් ද තත් කාලයෙහිම විනය පරීක්ෂණයක් පැවැත්වීමට විරුද්ධත්වයක් නැත.

11. 18:3:1 ශ්‍රී ලංකා නීතිය අනුව වරදකට වරදකරු බව ඔප්පු කෙරෙන තුරු සියළුම පුද්ගලයන් නිවරුදිකරුවන් බව පූර්ව නිගමනය කෙරෙන බව විනය බලධරයන් සිහි තබාගැනීම මැනවි. එබැවින් සාපරාධී වරදක් සම්බන්ධයෙන් යම් නිලධරයකුට එරෙහිව උසාවියෙහි නඩුවක් පවරා තිබෙන පමණින්ම ඔහුගේ වැඩ තහනම් කර තැබීම නොකළ යුතුය. එසේ වුව ද, රාජ්‍ය විරෝධී කටයුතුවල හෝ ත්‍රස්තවාදී කටයුතුවල හෝ නියැලීම වැනි අවස්ථාවල දී අනිවාර්යයෙන්ම ඔහුගේ වැඩ තහනම් කළ යුතුය. එබඳු අයෙකු යළි සේවයෙහි පිහිටුවීම කළ යුත්තේ මෙසේ ය. දෙපාර්තමේන්තු නිලධරයෙක් නම් යළි සේවයෙහි පිහිටුවීම කළ යුත්තේ අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසිනි. ඒකාබද්ධ සේවා නිලධරයෙක් නම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් විසින් යළි සේවයේ පිහිටුවීම කළයුතුය. මෙම සෑම යළි සේවයේ පිහිටුවීමක්ම නිලධරයා පිළිබඳව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විමසීමෙන් අනතුරුව ඔහුගේ ලිඛිත එකඟතාවය ඇතිව පමණක් සිදු කළ යුතුය.

18:3:2 නීතිය උල්ලංඝණය කිරීම හෝ සමාජයට එරෙහිව කළ යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලබන යම් නිලධරයකු පිළිබඳව අනුගමනය කළයුතු ක්‍රමය පහත සඳහන් පරිදි විය යුතුය.

(1) වැරදිවලට අත් අඩංගුවට ගෙන රක්ෂණ බන්ධනාගාර ගත කරනු ලැබ සිටින යම් නිලධරයකු සම්බන්ධයෙන් ගැනෙන කළ ඔහුට අනිවාර්ය නිවාඩු දිය යුතුය.

(2) ඔහු ඇප පිට නිදහස් කරනු ලැබේ නම් සහ ඔහුට විරුද්ධව ඇති චෝදනාවල ස්වභාවය අනුව ඔහු නැවත සේවයෙහි පිහිටුවීම රාජ්‍ය සේවයෙහි යහපතට හානිකර නොවේ යයි විනය බලධරයාට හැඟේ නම්, ඔහු නැවත සේවයෙහි පිහිටුවිය යුතුය.

(3) නමුත් ඔහු නැවත සේවයෙහි පිහිටුවීම රාජ්‍ය සේවයේ යහපතට හානිකර බව විනය බලධරයාට හැඟේ නම්, උසාවි නඩුවෙහි තීන්දුවක් ලැබෙන තුරු ඔහුගේ වැඩ තහනම් කළ යුතුය.

ඔහුට ගෙවිය හැකි වැටුප ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ විධිවිධාන අනුව නිශ්චය කළ යුතුය.

18:3:3 චූදිත නිලධරයකු චෝදනාවලට තමන් නිර්දෝෂීභාවය කියා සිටින්නේ නම් සහ විනය බලධරයා විනය පරීක්ෂණයක් පැවැත්වීම සුදුසු යයි කල්පනා කරන්නේ නම් 12:1 වගන්තියේ විධිවිධාන ද සලකා බලා පරීක්ෂණ නිලධරයකු පත් කළ යුතුය.

12. 18:6 පොලිස් දෙපාර්තමේන්තුව සහ / හෝ අල්ලස් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් යම නිලධරයකුට එරෙහිව ඇති චෝදනා පිළිබඳව අත් අඩංගුවට ගෙන, ඇප පිට නිදහස් කිරීම හෝ නඩු පවරනු ලැබීම නිසා වැඩ තහනම් කරනු ලැබූ විට තීරණයක් දීමට මාස 6 කට වැඩි කාලයක් ගත වන අවස්ථාවල දී ඔහු විසින් කරනු ලැබුවේ යයි චෝදනා කරනු ලබන වරද රාජ්‍ය විරෝධී කාරණයක් නොවේ නම් හා එසේ වැඩ තහනම් කරන ලද දින සිට මාස 6 ක් ගත වූ විට යළි සේවයේ පිහිටුවීමක් නොකොට අර්ධ වැටුප් ගෙවිය යුතු අතර, විනය පරීක්ෂණය තවදුරටත් පවත්වා ගෙන යා යුතුය. එසේම විනය පරීක්ෂණය කඩිනමින් අවසන් කිරීමට ද කටයුතු කළ යුතුය.

13. 21:6 යම් නිලධරයකුගේ වැඩ ඉහත සඳහන් වගන්තිවලින් නියමිත පරිදි තහනම් කළ නොහැකි වන්නා වූ, එහෙත් විමර්ශනයේ නොහොත් පරීක්ෂණයේ යහපත තකා එම නිලධරයා ඔහුගේ නිල කාර්යයන්හි නියුක්ත නොවිය යුතු තත්ත්වයක් පවතින්නා වූ අවස්ථාවක ද එම නිලධරයා වෙනත් ස්ථානයකට මාරු කර යැවීම හෝ XII වැනි පරිච්ඡේදයේ 20 වැනි වගන්තිය ( 1985 දී නිකුත් කරන ලද ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩය ) යටතේ ඔහු අනිවාර්යයෙන් නිවාඩු ගැන්වීම හෝ කළයුතු වන්නේය.

14. 21:7 නිලධරයකුගේ වැඩ තහනම් කිරීමේ දී ඔහුගේ පවුලේ ආර්ථික තත්ත්වය අවදනම් අවස්ථාවකට පත් වී එයින් ඔහුට අත්වන පීඩාවන් පිළිබඳව විනය බලධරයා සැලකිය යුතුය. ප්‍රමාණවත් සාක්ෂි නොමැතිව යම් නිලධරයකුගේ වැඩ තහනම් කිරීමේ දී ඔහු වරදකරු නොවන බව තීරණය වී යළි සේවයේ යෙදවීමට සිදුවීමෙන් ඔහු රාජකාරි ඉටු නොකළ කාලසීමාවකට ද වැටුප් ගෙවීමට සිදුවන හෙයින් එයින් රජයට පාඩුවක් වන බව ද සිහි තබාගත යුතුය.

15. තම ආයතනයෙහි පරීක්ෂණයට භාජනය නොවී පවත්නා විනය පරීක්ෂණ සංඛ්‍යාව එක් එක් තුන් මසක කාලයක් අවසන දී එක් එක් විනය බලධරයා විසින් මෙම චක්‍රලේඛයේ ඇමුණුමෙහි සඳහන් ආකෘතිය අනුව වාර්තා කළ යුතුය. ලේකම්වරයෙකු නොවන විනය බලධාරීන් තම වාර්තාව අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් එවිය යුතුය. මේ අනුව තම අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනවල විනය පරීක්ෂණ කටයුතු ලේකම්වරයාගේ දැඩි අධීක්ෂණයට භාජනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පළාත් සභා ප්‍රධාන ලේකම්වරයා සිය පළාත් සභාවේ ප්‍රගති වාර්තාව එවිය යුතුය. එක් එක් තුන් මසක කාලය අවසන් වූ පසු එළඹෙන මාසයෙහි 10 වන දින වනවිට එම ආකෘතිය රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.

16. රා.පරි.ච. 35/90 (1) හි සඳහන් විනය පරීක්ෂණය නිලධාරී මණ්ඩලය වෙනුවට නව නිලධාරී මණ්ඩලයක් යථා කාලයේ දී ප්‍රසිද්ධියට පත් කරනු ඇත.

17. මෙම චක්‍රලේඛයෙහි " විනය බලධරයා " යනුවෙන් අමාත්‍ය මණ්ඩලය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රාජ්‍ය නිලධරයන් පිළිබඳ පත්වීම්, ස්ථාන මාරුවීම්, සේවයෙන් පහ කිරීම් සහ විනය කටයුතු පිළිබඳ බලතල පවරනු ලැබ සිටින සියළුම ආයතන ප්‍රධානීන් අදහස් කෙරෙන අතරම ඔවුහු ඊට ඇතුළත් වෙති.

අ.කලේ/ (එම්.එන්.ජුනයිඩ්)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.